# *The four steps to Nibbana*

# *Eternal relief from the Life of suffering nature*

## පෙලීම් ස්වභාවකොට ඇති අසාරවූ දැවෙන සසරින් නිවීම(නිබ්බාන) උදෙසා අනුගමණය කළයතු පියවර සතර.

## **Introduction හැඳින්වීම:**

- '**Nibbana**' is a common phenomenon of Nature and the majority of Humans and Gods who attained Nibbana during the period of Buddha, were not all Buddists.
  'නිවන' යනු පොදු ස්වභාව සංසිද්ධියකි. බුදුන්දවස මගඵල ලැබූ අපමණ දෙවිබඹුන් හා බහුතරයක් මනුෂ්‍යයෝද බෞද්ධයෝ නොවූහ.
- '**Nibbana**' is a deep doctrine based on **Causation** and it is not recommended by Buddha($6^{th}$ BC),for those who are of extreme earthly(mundane) mindset and those who are of extremely divine mentality.
  හේතුඵලවාදය පදනම්කොටගත් ගැඹුරු දහමක්වූ **නිවන** නම්වූ මුල යතාර්ථය හුදෙක් දැඩි ලෞකික හා දේවගැති චින්තනයෙන් යුක්තවූවනට විෂය නොවනබව බුදුන් වහන්සේ විසින් වදාලහ.
- Nibbana is a deep Reality which is difficult either to explain or to understand by any other earthly or highly divined languages rather than '**Magadhi**',the language used by Buddha. නිබ්බාන නම්වූ අතිශය ගැඹුරු යතාර්ථය පැහැදිලිකරදීම හෝ අවබෝධ කරගැනීම බුදුන්ගේ භාෂාව හෙවත් **'මාගධි'** බසින් හැරුනුකොට අන් කිසිදු බසකින් පහසු කරුණක් නොවන්නේයයි බුදුන් වහන්සේ විසින්ම දැනවදාලහ.
- Damma preached by Buddha in '**Magadhi**' language($6^{th}$ BC) was transferred in to '**Pali**' at first by Moggaliputtathissa Thero($3^{rd}$ BC) and secondly by Buddhagosha thero($5^{th}$ CE) in Anuradhapura. '**මාගධි**' බසින් දේශිත නිර්මල බුද්ධ ධර්මය පළමුකොට **පාලිය**ට නැගුනේ ක්‍රි පූ 3 වන සියවසදී ඉන්දියාවේ මොග්ගලීපුත්තතිස්ස තෙරුන් විසින්ය දෙවනුව ඉන්දියාවෙන් පැමිණි බුද්ධගෝෂ තෙරුන් (ක්‍රි ව 5 වැනි සියවස) අනුරාධපුර මහාවිහාරයේ වසමින් **මාගධි** බසින් තල්පත්හි ලියාතිබුණු ත්‍රිපිටකය නැවත **පාලිය**ට නැගීය

**'මාගධි'** බස බිඳී අර්ථ දැක්වෙන්නේ මෙලෙසින්ය; Let's see how the language 'Magadhi' is composed by the linguistic analysis;

**'Magga'**(path)+ **'Agadhi'** (the four degrees of Nibbana(Enlightenment) =**'Magadhi'** (language for Nibbana).

**මග්ග(**මාර්ගය) + **අගධි**(අග්ග සෘධි ) = **'මාගධි'** (නිවනට නිසි බස)

## Entrance to the first step පළමු පියවරට ප්‍රවේශය:-

*[It is a useless exercise if somebody practices for 'Nibbana' without understanding of 'Thi-lakkana' the three features of LIFE.*

*ජීවිතයේ අසාරබව හෙවත් **ත්‍රිලක්ෂණය** ගැඹුරින් අවබෝධ නොකළාවූ තැනැත්තෙකු විසින් භුදෙක් සෑධී ලැබීමේ හෝ වෙනයම් අපේක්ෂාවෙන් නිවන්මගට පිවිසේද එය නිෂ්ඵල ව්‍යායාමයක් වන්නේය ]*

**Step-01**: Comprehension of the **'Three Features of LIFE'**

**පළමු පියවර**: **ත්‍රිලක්ෂණය** තේරුම් ගැනීම

1. 'Anichcha' = Ana(no) +Ichcha(like)= happenings not on will– Reluctance–

   **'අනිච්ච' = අන** (නොම) **+ ඉච්ච** (කැමැත්ත) =තමා කැමතිසේ නොපැවතීම
2. 'Dukka' =Ana(no)+Panihitha(pleasing)= 'Appanihitha' =happenings to end up with Pain– Sorrow–

   **'දුක්ඛ'** = දුක් හේතුකොටගත් තැවීම්සංඛ්‍යාත වේදනාව.
3. 'Anaththa' =Ana(no)+Aththa(means)= existence not upon self means – Passivity–

   **'අනත්ත'** = **අන**(නොම) + **අත්ත**(සවාර්ථය) -තමනට ආත්ම වශයෙන් (සවාර්ථය පරිදි) නොපැවතීම.

*['Those who comprehend the **Thilakkana**, tends to search whether there is any solution for this problem.*
*ජීවිතය පිළිබඳ යතෝක්ථ ත්‍රිලක්ෂණය ප්‍රත්‍යක්ෂ කරන්නාවූ අයෙක් මීට යම් පිළියමක් ඇත්දැයි සොයා බලන්නේය.]*

**Step-02**: Awareness of the **Four Realities of 'LIFE'**

**දෙවන පියවර**: **සත්‍යය සතර** වටහාගැනීම

1) Realiy of 'Dukka' (as a whole, life is of suffering nature)

   **දුක්ඛ සත්‍යය**: ජීවිතයෙහි ඇති වේදනාකාරී තැවීම්සංඛ්‍යාත සවභාවය
2) Reality of 'Samudhaya' (causation behind the suffering)

   **සමුදය සත්‍යය**: දුක හටගැන්මට හේතු ඇතිබව
3) Reality of 'Nirodha' (elimination of the inner causation for suffering)

   **නිරෝධ සත්‍යය**: හටගන්නා හේතු නිරෝධය

4) Reality of 'Magga' ( pathway for elimination of life suffering)

**මාර්ග සත්‍යය:** දුක්ඛ නිරෝධයට **මගක්** ඇතිබව

*[Not only poverty stricken or suppressed people, but also even well-established public in a society, are suffered all the same from **depression** and looking for a **Path** for **relief.** There are many paths available but it is extremely difficult to find the correct Path to eliminate 'Dukka'. Therefore Buddha has set the first step as '**San Ditthi'** to find the **correct Path** towards the destination of Relief-**'Nibbana'**–දුකින් මිදීමට **මගක්** ඇත්දැයි සොයනුයේ, හුදෙක් අසරණව භෞතික වශයෙන් දුක්පීඩාවනට ගොදුරුවූවන් පමණක්ම නොවේ. අපේක්ෂා භංගත්වය මානසික ආතතිය හා දිවියෙහි අසාරබව ග්‍රහණයකළ ඉසරුමතුන්ද මින් ගැලවීමට **මගක්** සොයන්නෝමවෙත් .*

*බොහෝ මාවත් තිබුණද නිවැරදි මගතෝරාගැන්ම නුවණින් කළයුත්තක් වනබැවින්, **අරි අට මගෙහි** පළමු පියවර '**සම්මා දිට්ඨිය**' ලෙසින් බුදුන් වහන්සේ විසින්මැ දැනවදාල බව මෙහිලා සිහිකටයුතු වන්නේය]*

## Step-03: 'Noble Eight-Juncture Path'

**තෙවන පියවර** : අරි අට මග

*For the Mindset (චිත්ත විහිටීය අරභයා)*

1. 'Samma Ditthi'-Corect **Vision –සම්මා දිට්ඨි**- නිවැරදි දැක්ම
2. 'Samma Sam+kappa' –Correct thoughts- **සම්මා සංකප්ප**- නිවැරදි සිතුවිලි උපදවීම

*For the behavior (චර්යාව අරභයා)*

3. 'Samma Wacha'-Correct **Usage- සම්මා වාචා** -නිවැරදි වහර
4. 'Samma Kammantha'-Correct means of **making a living- සම්මා කම්මන්ත** -නිවැරදි රැකියාව
5. 'Samma Ajeewa'-Correct **behavioral living- සම්මා ආජීව** -නිවැරදි වෘතය

*For the Astral Body (මනෝකාය අරබයා)*

6. 'Samma Vayama'-Correct **Exercise** for mental concentration (meditation)- **සම්මා වායාම**- නිවැරදි භාවනාව
7. 'Samma Sathi'-Correct **Mindfulness - සම්මා සති** -නිවැරදි ස්මෘතිය
8. 'Samma Sam+Idhi'-Correct **Enlightenment - සම්මා සමාධි** -නිවැරදි සෘධින් උපදවීම





**FIGURE-01(Noble eight- juncture Path)**

*[The 8th juncture is the final terminal of decision making whether to 'End up the **Sansara-Cycle of Rebirths**-'or to 'Remain in the Cycle, so further. There are **three destinations** possible at the '**End-Terminal-8**.' අරි අට මගෙහි ගමන්කොට අටවැනි සන්ධිය කරා එළඹ සිටි පුද්ගලතෙම, එතැන්හිදී කඩයිම් තීරණයක් ගතයුතු වන්නේය. එනම් , එළඹ සිටි මෙම භවයේදීම නිවන් අරමුණු කෙරෙම්ද නොඑසේනම් මතු එලැඹෙන්නාවූ භවයෙක්හිදී නිවන් දක්නේද යනුයි. එම තීරණය අනුව පුද්ගලයාවිසින් සපැමිනියහැකි ගමනාන්තයන් **තුනක්** වන්නේය*

I. *<u>Correct Enlightenment</u>: End entity of the Life Cycle (Nibbana) <u>'සම්මා සමාධි(**විදස්සනා සමාධි**)</u>': සසරමග අවසන් භාවයවූ 'නිවන' .*
II. *<u>Incorrect Enlightenment</u>: Births in Heavens of the supreme level (Deva, Brahma, Rupavachara, Arupavachara)-'අසම්මා සමාධි' (**සමත සමාධි**): ශුද්ධාවාසයන් (දේව, බ්‍රහ්ම, රූපාවචර, අරූපාවචර) හි උපත.*
III. *<u>Waiting at the 8th terminal</u>: Births in Human world or Heavens waiting in commitment for the **prospective** Buddha ship, Pachcheka Buddha ship, or intended Maha Arahath ship. සම්මා සතියෙහිම භව අරමුණින් යුතුව නැවතුම: '<u>බුදු</u> ,පසේ<u>බුදු</u> ,මහරහත් යන තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකින් නිවන් ලැබීම අරමුණුකොට මිනිස්ලොවෙහි හෝ දෙව්ලොවෙහි උපත.*

*The first path was addressed as '**Theravada Buddhism**', of which Bikkus(theros) live isolated from the community in jungles and caves upon hard practice of '**Samma Samadhi (Vidassana)**', aiming Nibbana in this life itself. සම්මා දිට්ඨි නම් නිවන්ගාමී මගෙහි පිලිපන්නාවූ යෝගාවචරතෙම හෝ **'ථේරවාද භික්ෂුව'**, වන අරණෙහි හෝ ලෙන් ආදියෙහි වැඩවසනුයේ, තමනට සුදුසු 'විදස්සනා' කමටහනක් අනුවයමින්, සෝවාන් සක්කදාගාමී අනාගාමී සහ අරහත් යන සතර **අගඩි** (අග්‍ර සෘධි) අරමුණුකොට වෙසෙයි.*

*The practitioner of '**Samatha**' in the second path could be deserted at the uppermost levels of the worlds, as Buddha declared, where time is elapsed very slowly. විදස්නාව ඇසුරු නොකරන්නාවු **සමත සෘධීන්** වඩන්නවුන් මරණින් මතු ඉතා දීර්ග ආයුෂඇති **ශුද්ධාවාසයන්හි** උපදනාහ.*

*The practitioner who stops at the 8th terminal in the aim of prospective 'Bodhi's(high destinations as Buddha ship, 'Pachcheka Buddha' ship and 'Maha Arhath' ship are belonged to '**Mahayana Buddhism**' and they get births in Heavens and Human World as well. අරි අට මගෙහි අටවැනි සංධියෙහි භව අරමුණින් නවතින්නාවූ යෝගාවචරතෙම අපේක්ෂිත **මහා යානයම** ලබනතෙක් සසරෙහි ඉපිද කල්යල් බලන්නේය. බොහෝවිට තමාපමණක් නොව තම හිතමිත්‍රාදීන් ද ඇතුලු සමාජයද කැටුව යන්නෙමැයි යනසිතැති පරාර්ථකාමී පුද්ගලයින් අවසන බුදුබව හෝ මහරහත් බෝධීන් ලබන්නාහ. බුදු අසිරියටම පමණ් ලොබබැඳ පරාර්ථයෙහි නොයෙදුනාවූ වීර්යවත් පුද්ගලයින් පච්චේකබුද්වත්වයෙන් තනිව නිවනට යන්නාහ.*

There are two doctrine fields beyond the 8th terminal such as; අරි අට මගෙහි අටවන සංදිස්ථානයහි නොනවතින්නාවූ අයෙකුහට යාමට ඇති මාවත් දෙකකි;

1. Samatha Samadhi (Enlightenments through Concentrated Mind–meditation) **චිත්ත ඒකාග්‍රතාව තුලින් සෘධි උපදවීම:**

[Sama (not changed) + **hitha** (mind) = **Samatha** (concentrated mind) **සම**(නොවෙනස්) + **හිත**(චිත්තය) = **සමත**(චිත්ත ඒකාග්‍රතාව)]

What are the special enlightenments they could attain? සමතයෙන් කුමණ සෘධීන් උපදවිය හැකිද ?

I. Distant observing (**Dibba Chakku**)–දිව ඇස
II. Distant hearing (Dibba Sotha)– දිව කණ
III. Watching (*limited*) of the past births (**Pubbe Nivasanusmuthi**)–පෙර භවයන් දක්නා(සීමාසහිත) නුවණ
IV. Sagacious miracles (Iddhi)–සෘධි ප්‍රාතිහාර්යයන්

2. Vidassana Samadhi (**Correct Enlightenment to penetrate for the truth**) **සත්‍යය විනිවිද දක්නා සෘධි උපදවීම**

*[**Vidu** (penetrating for the truth) + **Dassana** (comprehension) =Vidassana)]*

*[**විදු**(විනිවිද) + **දස්සනා**(අවබෝධය ) = **විදස්සනා**(සත්‍යාවබෝධය].*

What are the special fruits of '**Vidassana**' could be attained by the practitioner? **විදසුනෙන්** ලද හැකි ඵලයන් :

1) Sothapanna (first degree of the correct Enlightenment) **සෝවාන් ඵලය**
2) Sakkadagami (second degree of the correct Enlightenment) **සක්කදාගාමී ඵලය**
3) Anagami (third degree of the correct Enlightenment) **අනාගාමී ඵලය**
4) Arahath ( fourth degree of the correct Enlightenment) **අරහත් ඵලය** (=Nibbana නිවන)

*[Those who pass the 2nd doctrine field path-'Vidassana', automatically attain the fruits of the 1st doctrine field path also. But there are always limits with the capacity of Enlightenments, depend on their thoroughness in the particular subject fields. **විදසුන්** වඩා නිවනට පිළිපන් අරහතුන් කෙරෙහි **සමතයෙන්** අරමුණුකළ සෘධීන්ද උපදින්නේමය. එහෙත් සසර*

*ගමනෙහිදී තමන් විසින් මනාසේ ප්‍රගුණකරනලද **විෂයගේත්‍ර මට්ටම්** අනුවම තම සෘධි ප්‍රාතිහාර්යයන්හිද සීමාවන් පැනවෙත්.]*

**<u>Step-04</u>:** Penetration through(**Vidassana**) to see '**Patichcha Samuthpada Damma**' -the Mechanism behind Life. - **(විදස්සනාව** මගින් හේතුඵල විනිවිද, '**පටිච්ච සමුත්පාද ධම්ම**' නමැති **භවසංසිද්ධය** පිරිසිඳ දැකීම)

'Patichcha Samuthpadha' – (the phenomenon of Self cultured Life) **තමාවිසින්ම පටලාගත් ජීවන මූලයාන්ත්‍රණය:**

1. 'Avidya' (the faulty claim as Me & Mine) **අවිද්‍යා**–[ "Asmithi bhikkawe mangnamano badedha marassa" 'අස්මිති භික්කවේ මඤ්ඤමානෝ බදෙධා මාරස්ස'- 'මහනෙනි **අස්මී** නම්වූ **මනෝමානය** විසින්ම මාරබන්ධනයට හෙවත් සසරට නතුකෙරෙන්නේමැවේ. ']

2. 'Sankara' (thought fabrication upon the incoming signals)**සංස්කාර**–[ '**අවිද්‍යා පච්චයා සංකාරා**' අවිද්‍යාව හේතුකොට **මනෝ ගෙත්තම්** (චිත්ත රූප) නිමකෙරේ ]

3. 'Vinnana' ( Library of the Astral Memory)**විඤ්ඤාන** –( 'සංකාර පච්චයා විඤ්ඤාන')-**සංස්කාර**(මනෝගෙත්තම) හේතුකොට **මනෝමතය** ගොඩනැගේ

4. 'Nama+Rupa' (name tags upon figures to be stored ) **නාම රූප** - ('විඤ්ඤාන පච්චයා නාමරූප') - **මනෝමතය** නම්කොට ගබඩාකෙරේ ]

5. 'Salayathana' ( the six sensory organs in the body)**සලායතන** – ('නාමරූප පච්චයා සලායතන' **නාමරූප සංචිතය** හේතුකොට සංවේදී **ඉන්ද්‍රිය** සැකසේ)

6. 'Passo' (creating of signals by impacts)**පස්සෝ** –('සලායතන පච්චයා පස්සෝ' – **සලායතන** හේතුකොට **ස්පර්ෂය** ඇතිවේ)

7. 'Vedana' (feeling by signals) **වේදනා** –('**පස්ස** පච්චයා **වේදනා**' - ස්පර්ෂය හේතුකොට වේදනා ඇතිවේ)

8. ‘Thanha’ (Cohesiveness upon feelings) **තන්හා** –(‘වේදනා පච්චයා තන්හා‘ සුඛ හෝ දුක වශයෙන් වේදනාවකෙරේ ඇලීම)

9. ‘Upadana’ (Deposits in the **Astral Bank** with the signals good or bad) **උපාදාන** –(‘තන්හා පච්චයා උපාදාන‘ - සුබ හෝ අසුබ සංඥාවෙන් යුතුව මනෝමතය ගබඩාකෙරේ )

10. ‘Bhavo’ (Reincarnation owing to the astral bank **deposits**) **භව** – [‘උපාදාන පච්චයා භවෝ‘ – උපාදාන තැන්පතු(කර්ම බීජ) හේතුකොට **පුනර්භවය** ඇතිවේ ]

*[The red entity ‘Thanha’is the unique mentality to be eliminated by any practitioner for Nibbana. නිබ්බානගාමී යෝගාවචරයා විසින් වීර්යයෙන් යුතුව සිඳදැමිය යුත්තේ* ***තන්හා*** *චෛතසිකයයි*
***Patichcha Samuthpada****(‘Mechanism behind LIFE’) is a deep Scientific Phenomenon of LIFE declared by Buddha (6th BC). The path up to ‘Samma sathi’(correct mindfulness) was available even before Buddha and the practitioners harvested the fruit of Divine and Supreme Humanity.*
*But there was no doctrine to show the path to exit from this eternal Life Cycle until Buddha found this theory to exist. ක්‍රි පූ 6 වැනි සියවසෙහිදී බුදුන්වහන්සේ විසින්* ***පටිච්ච සමුත්පාද*** *නමැති* ***ජීවයෙහි යාන්ත්‍රණය*** *දැන භවනිරෝධය කැරෙනා සංසිද්ධිය සොයාගන්නාතුරු ‘නිවන‘ නමැති සසරින් නික්මීම කිසිවෙකුටත් කළනොහැකිවිය. අරිඅට මගෙහි අටවැනි සංදිය නිවැරදි දිශානතියෙන් පසුකිරීමට අපොහොසත්වූ මනුෂ්‍යයෝ සුගතිගාමී මනුභවයන්හි දෙව්ලොවෙහි හෝ ශුද්ධාවාසයන්හී උපත ලදහ.*

Buddha’s Visual- example of the ‘**Guarded Information City**’ for the easiest and exact way to attain Nibbana:
බුදුන්වහන්සේ වසින්ම නිවනට කෙටිම මග ලෙස උපමාකොට වදාල ද්වාර සයකින් හෙබි **‘යථාසන්නිවේදනයේ නගරය‘:**





**FIGURE-02**(Buddha's visual -the exact way to Nibbana)

**<u>Special Note-01</u>** (Soul Evolution)

*Origin, Existence and End of LIFE is defined by Buddha upon the theory of Causation. According to many other religions the Destination of human life were described as the eternal **Heaven** or **Hell**. The oldest religion Hinduism being more close to the reality defined it as a never ending **Life Cycle**. Only Buddha has explained the how Mankind was created ultimately as a result of the long term natural process of '**Soul Evolution**' . Also Buddha is the first to explain the way how to exit from the eternal Life Cycle by **eliminating the causation**. හේතුඵල දර්ශණයට අනුව ජීවයේ උපත පැවැත්ම හා නැවැත්ම යන ත්‍රිවිධ අවස්ථාව බුදුන්වහන්සේ විසින් අවබෝධකොට ඉදිරිපත්කළ ආකාරය 'පටිච්ච සමුත්පාදය' වන්නේය. බොහෝ දේව ආගම්හි දැක්වෙන අයුරු මනුභවයේ අවසානය සදාකාලික දෙව්ලොව හෝ නිරය වන්නේය හින්දු ආගමෙහි එය දෙව්මිනිස් ලෝක අතර සදාකාලික චක්‍රයක් ලෙස දැක්වෙයි. මිනිසාගේ ප්‍රභවය දීර්ගකාලීන සවභාවික ක්‍රියාදාමයක්වූ '**භව පරිණාමයෙහි** ' ප්‍රතිඵලයක් වනබව පළමුව ලොවට හෙලිකළේ බුදුන්වහන්සේ විසින්ය. නිවීම(**නිබ්බාන**) හෙවත් නැවැත්ම නම්වූ ජීවයේ අවසානය ලොවට අර්ථදැක්වූයේද බුදුන් වහන්සේම පමණකි .*

***Evolution*** *of the physical '**World of Matter with Life'** has been reviled by Science (Charles Darwin-1809) . The mechanism of '**Soul Evolution'** behind the eternal 'Life Cycle' was declared only by Buddha(6th BC) by his theory of **Reincarnation** based on **Kamma** (results of behavioral deeds). භෞතික පදාර්ථයෙන් ගොඩනැගුනු ජීවය සහිත ලෝකයේ පරිණාමය විද්‍යාත්මකව සනාථකළ සංසිද්ධියකි (ඩාවින් -1809). සියුම්ව ඇරඹී ජීවය පුනර්භව සංසිද්ධිය මගින් '**භව පරිණාමයෙක**' යෙදන අයුරුද එමගින් සත්වයා අවසන මිනිස් ආත්මභාවය ලබා, තම චර්යාව විසින් ඉතිරි කරනුලබන **කර්මබීජ** අනුව යක්ෂ දේව හා බ්‍රහ්ම ආදී තලයන්හි හෝ නැවත තිරිසන් ආදී අපාභාවයන්හිම හෝ උපදනා බව පළමුව ලොවට හෙලිකරනු ලැබයේ බුදුන් වහන්සේ විසින්මය.*

Buddha has declared five **Laws of Nature** which accounts for *Origin*, *Existence* and *Evolution* of the **World with Life**. ජීවය සහිත ලෝකයෙහි ආරම්භය විකාශණය හා පරිණාමය පිළිබඳ මෙහෙයුම් බලය විග්‍රහකෙරෙන නියමයන් පහක් බුදුන් වහන්සේ දේශණාකොට ඇත:

1. **Ithu Niyama**(Change in Climate)-**ඍතුනියාම** (කාළානුරූපව සිදුවන පාරිසරික පරිවර්තණය)
2. **Beeja Niyama**(Diversity of flora &Fauna)-**බීජ නියාම** (ජෛව විවිධාංගීකරණය)
3. **Chiththa Niyama**(Mind in Fauna)-**චිත්ත නියාම** (සත්ව සන්තානය පහළවීම)
4. **Kamma Niyama**(Deposits in astral mind to make Future)-**කම්ම නියාම** (චෛතසික ආරම්මණ අනුෂයවීම තුලින් ඉදිරිය සඳහා කර්මබීජ හෙවත් උපාදාන තැන්පතුව)
5. **Damma Niyama**(the Order of Nature)-**ධම්ම නියාම** (සොබාදහමේ රීතිය)

The five aforesaid laws describes all the phases of the change such as; **Origin**, **Existence** and **End** of the entire 'Nature Dynamics of Life'.ජීවය සහිත ලෝකයෙහි ඇතිවීම පවැත්ම හා විනාශය යන ත්‍රිවිධ අවස්ථාවම යතෝක්ථ පංච නියාම ධර්මයන්ගෙන් මොනවට පැහැදිලි කෙරෙයි.

**Special Note-02** (Nature Dynamics of Life)

***Creation*** *of the **World with Life** has been referred by Buddhist Philosophy to the **Causation** of NATURE driven by the mechanism of '**Evolution**'. It is well indicated by the Gatha phrase;*

***"උපනීයති ලෝකෝ අද්ධුවෝ- අත්තාණෝ ලෝකෝ අනභිස්සරෝ "***

*"Changing Nature runs the World forward -Neither Ruler nor Protection there" 'වෙනස්වන ලෝකය ඉදිරියට දිවයයි- එහි **පාලකයෙකු** හෝ **ආරක්ෂාවකුදු** නොමැත.'*




**FIGURE-03(Evolution of Souls in the Life Cycle)**

"LOVE is the **Intelligence** and it is the prime qualification for Divinity and Happy Humanity". 'දේව හා සමෘධිමත් මනුසත්භව ලැබීමේ එකම රහස අන්‍යයනට ඇති **දයාව** බව පසක්කළහැක්කේ එහි යාන්ත්‍රණය වටහාගත් ප්‍රඥාවන්තයින්ට පමණකි.

**<u>Special Note-03</u>** (No conflicts with other religions)

*Buddhism is not a religion of **inactivity** and **reluctance** as many people guess by the looks. Buddha has shown the path for 'Happy-Happy-Life' by many of his 'Damma Suttas'. All his Damma messages could be briefed in to; "**<u>Commitment to make others happy is the path for 'Happiness</u>**" වැඩිදෙනෙක් සිතනා අයුරු බුදුදහමයනු සියල්ල දුක් වශයෙන් සලකා සියල්ල අතහැර අකර්මන්‍යව බවුන්වැඩීම වන්නේය. එය බැහැරකළයුතු වැරදි මතයක්වන්නේ මක්නිසාදයත්, අසීරු දූතාංග රකිමින් අතිශය වෑයමින් ශුෂ්කවිදර්ශක රහත්බව ලබාගත් අයවලුනට වඩා **සැපෙන් සැපයට** පැමිණ නිවන්දුටු දෙවිමිනිස් සංඛ්‍යාව බෙහෙවින්ම වැඩිවන බැවිනි. මෙම මොහොතේ පවා අනාගාමීව නිවන්කරා සපැමිණෙන සම්‍යක්දෘෂ්ඨික දෙවිවරුන් කොතෙකුත් සිටියහැකිය.*

*The 'Absolute Truth' in NATURE is common as a whole, for all the Mankind, in spite of their cultural, religious or national boundaries. There is no need at all to be a Buddhist to know the truth of the World. Religious Diversity too is an essential feature to be preserved as same as the Biodiversity in Nature.*

*බුදුන් ලොවට හෙලිකළේ සොබාදහමෙහි රීතියවන බැවින් එම විද්‍යාදර්ෂණය කිසිදු භේදයකින් තොරව ලොවසියලු ජනයාට අයත් විශයයකි. විද්‍යාවිශයයක් ඉගෙනීමට කිසිවෙක් තම ආගම අතහැරීම අවශ්‍යය නොවන අතර ආගමික හා සංස්කෘතික විවිධංගීරණයද සමාජයක අවශ්‍යයෙන්ම රැකගතයතු ස්වභාව අංගයක් වන්නේය.*

**<u>Special Note-04</u>**:(Meditation)

What is Meditation for?- භාවනාව කුමක් සඳහාද?
Meditation is for mental concentration- මනෝ ඒකාග්‍රතාවය සඳහාය
What is mental concentration for?- ඒකාග්‍රතාවය කුමක් සඳහාද?
Mental concentration is for Enlightenment- සම්මා සමාධිය පිණිසය
What is Enlightenment for?- සම්මා සමාධිය කුමක් පිණිසද?
Enlightenment to attain Nibbana- නිවන පිණිසය

<u>'**නිවන** නමැති ගැඹුරු යථෝභාවය පසක් කළහැක්කේ **සමත සෘධින්** තුලින් නොව යොනිසෝ මණසිකාරයෙන් වැඩෙනා **විදස්සනා ප්‍රඥාව** තුලින්මය' Nibbana could be attained only by the correct enlightenment -'Samma Samadhi(Vidassana)'</u>

*Buddha has never addressed the WORLD entity alone without referring '**World with Life**'. Physics has been deserted today in uncertainty in the far analytical exploration for MATTER alone without combining the WORLD entity with LIFE. '**Vidassana Samadhi**'*

*doesn't allow Mind to go far away from the body behalf of Enlightenments and instead Buddha has ordered to see the WORLD within your own Body.* *බුදුන්වහන්සේ ලෝකය පිළිබඳ විවරණයේදී පදාර්ථයේ අනන්ත මායිම් සොයා දිවනොගොස්, මේ බඹයක් පමණවූ ශරීරය තුලම ලෝකය දකුවයි වදාලහ.* ***කායගතාසතිය*** *යනු හුදෙක් මනෝරූප මවමින් ඈතදිවයන සිතට කයින්බැහැර නොයනලෙසට භාවනාවේදී පණවනුලබන තහන්චියයි.*

[*අරි අට මගෙහි අවසන් මංතීරුවෙහිදී* ***සම්මාසමාධි*** *උපදවා නිවන අවබෝධකිරීම වනාහි  කිසිදු භාෂාවක හෝ ගණිතආදී ශාස්ත්‍රයක පියවර පටිපාටියක්සේ  අනුගමනය කිරීමෙන් ලදහැක්කක් නොවන්නේය තවද කය පිලිබඳවම සිහිය කේන්ද්‍රකොටගත් දැඩි කායගතාසති භාවනා කමටහනින්ද නිවන දුරස්ථ වනුයේ ඉන්* ***කායපඨවිය*** *පිළිබඳ ඇතැයියන 'අස්මිං   මඤ්ඤනාව' යෝගාවචරයා තුල නිතැතින්ම ගොඩනැගෙනා බැවින්ය.  කායගතා සතිය ඇවැසිවන්නේ නිරන්තරයෙන්ම කයෙන්බැහැරව දිවයෑමටම අරඅඳිනා සිත ප්‍රඥාවෙන්  නිවන්මගකරාම යොමුකිරීමටය*
*කිසිදු කමටහනක් දිගුකාලීනව වැඩීමෙන් හෝ ශුෂ්ක දූතාංග රැකීමෙන්ද තොරව  රජඇඳුමෙන් සැරසී සිටියදීම රහත්බවට පත්වූ සන්තතිඅමාත්‍ය වෘතයෙන්ද දාරුචීර සෝපාක ආදී වෘතයන්ගෙන්ද සනාථ වනුයේ ප්‍රඥාවම නිවන පිණිස හේතුවනබවය තවද* ***ප්‍රඥාව*** *යනු හුදෙක් දැණුම උගත්බව හෝ බහුශ්‍රත බව නොව යමක් විනිවිද දක්නා* ***පරිඤ්ඤා අභිඤ්ඤා*** *වශයෙන් දක්වනු ලබන යම්විටෙක කුඩා ළමයකුතුල වුවද පහලවියහැකි විශිෂ්ඨ මණෝභාවයකි*

## Can you accept something without knowing its Literature?
### සම්භවය නොවිමසා කරුණ පමණක් පිළිගැනුමට තරම් අවිචාරවත් වන්නෙමුද?

**Special Note-04**:

*04.1-'Pali' was not Buddha's language at all. 'Pali' is recorded as to have some shallow origin in 'Magada' of north India by the 3rd century BC (but there is no residue in the today's language in usage).  Buddha has lived by the 6th century before Christ which is quite older than the birth of Pali.*      *පාලි භාෂාව බුද්ධ භාෂාව නොවේ.  ක්‍රි පු 3 වැනි ශතවර්ෂයට වඩා පැරණි කිසිදු ඓතිහාසික වාර්තාවක් පාලිබස පිළිබඳව ලෝකයෙහි දකින්නට නොලැබෙයි.  බුදුන්වහන්සේ වැඩසිටියේ ක්‍රි පු 6 වැනි සියවසෙහිදීය.*

*04.2- As per the historical records, Moggaliputtathissa thero of Magada had translated 'Thripitaka' in to 'Pali' by 3rd BC by the period of king 'Asoka' after his becoming of a Buddhist.* *අශෝක රජුදවස (ක්‍රි පු 3 වැනි ශතවර්ෂය) ඉන්දියාවේ මොග්ගලීපුත්තතිස්ස තෙරුන් ත්‍රිපිටකය පාලි බසට පෙරලා සංගායනාවක්ලෙස ප්‍රචාරයට පත්කළබව පාලි භාෂාව පිළිබඳ අසන්නට ලැබෙන පළමු වාර්තාවයි.*

*04.3- Again an incident was recorded by 5th century CE, a thro from Magada of India- Buddhagosha who came to 'Mahavihara University' of Anuradhapura in Sri Lanka, to learn Buddhism, has converted the 'Thripitaka' (written in palm leaves) in '**Magadhi language**' in to 'Pali'. It is also recorded that he has spread* those

*translated 'Thripitaka' in Pali in to other countries too such as; Bangladesh, Laos, Tibet, Indonesia, Myanmar etc. දෙවනුව පාලිය පිළිබඳ වාර්තාවන්නේ ක්‍රි ව 5 වැනි සියවසේ ශ්‍රී ලංකාවෙනි. ඉන්දියාවෙන් පැමිණි අනුරාධපුර මහවෙහෙර වාසීව බුදුදහම ඉගෙනගත් බුද්ධඝෝෂ නම් භික්ෂුවක් විසින් එවකට හෙළබස හෙවත් **මාගධී** බසින් තල්පත්තිරු පුස්තකයන්හි ලියාතිබූ ත්‍රිපිටකය **පාලි** නම් බසකට පෙරලීමට ථේරවාද මහවෙහර භික්ෂූන්ගෙන් අවසරලබාගනියි. පසුව එම පාලිපිටපත් කාම්බෝජය බුරුමය ලාඕසය ඉන්දුනීසියාව ආදී අනෙකුත් රටවල ව්‍යාප්ත කරවයි.*

*04.4- At the same time a thero Mahanama, colleague of Buddhagosha, who also came from India to Mahawehera, translates 'Mahawansa' &'Chulawansa', the Sinhalese History in to **Pali** language. He starts Lankan history so as to begin from the king 'Vijaya'- the invader also from India(5th century BC). In that mission, Mahanama thero has purposely effaced Lankan great history which should run beyond some 5000-7000 years in to the past towards world renowned emperor Rawana of Lanka pura. When the mission was completed the seven storied library building, in which all the books about Dhamma, Buddist Culture and famous Lankan indigenous medicine written in ancient Sinhala (Magadhi) language, was set fire by a planned sudden attack from some foreign platoons. No trace of both Buddhagosha and Mahanama recorded thereinafter in Sri Lanka. තවද මෙසමයෙහි එවැනිවම ඉන්දියාවෙන් පැමිණී මහානාම යන භික්ෂුවක් ලංකා ඉතිහාසය පාලියට පෙරලන්නේ, ඉන්දියාවේ මගධයෙන් නෙරපාහරිනුලැබ ලංකාවට පැමිණි පාලනබලය අල්ලාගත් විජයගෙන් එපිට වසර පන්දහසට වැඩි සක්විති රාවන යුගයකරා දිවෙන සිහල ඉතිහාසය සහමුලින්ම මකාදමමින්ය. එපමණක්නොව සිංහලයේ මහා පොත්ගුලවූ සත්මහල් දැවමය ලොවාමහාපායද ගිනිතබා විනාශකොට දමනලද්දේය. අද එහි දක්නට ඉතිරිව ඇත්තේ පාදම ගල්කණු පමණකි (රූපය-04).*

4.5- Buddhists in all over the world know that, Buddha was born in 'Jambuddvipa'. According to the linguistic analysis of the Magadhi term Jambodvipa is composed such as;

**Jamma**(birth) +**Buddha** +**Dvipa**(island) =**Jambuddvipa**(the Island which gave birth to Buddha)

**ජම්ම + බුද්ධ + ද්වීප = ජම්බුද්වීප (සියලු බුදුවරුනට ජන්මසාධකවූ දිවයින)**

That is not India but it is Sri Lanka- the only isolated Buddhist Island in the world. බුදුන් උපතලද දිවයින ශ්‍රී ලංකාවයි. ඉන්දියාව දිවයිනක් හෝ බෞද්ධ රටක් නොවේ. තවද බුදුසිරිතට අනුගතවන සියලු පූජනීය ස්ථාන මේවනවිට ශ්‍රී ලංකාවෙහි

හඳුනා ගනු ලැබ ඇති අතර සියලුම ශාරීරික ධාතූන් වහන්සේලා වැඩසිටිනුයේද අප රටෙහිය. If you are interested to read the real history of Buddhism please refer to http://www.cyrilhtgamage.com/index.php/publication-engineering/88-publication/188-the-deprived-pride-by-the-poems-of-history .



**'Lovamahapaya'** in **Anuradhapura** was built by the king **Dutugamunu- 2nd BC**, as a seven storied wooden building of a Library. (The stone columns so densely planted in the foundation indicates the size of the structural load transferred from seven floors above.) The world renowned Buddhist library of **Mahavihara University** was kept open for foreign students too. Both **Buddhagosha** and **Mahanama** from **Magada** have studied Buddhism in the same University -**5th CE**. **Buddhagosha** translated Sinhala '**Thripitaka Dhamma**' in to a language '**Pali.** By the same period**, Mahanama** writes the poem of a shallow Lankan history '**Mahawansa**'in Pali language. No information of the authors, after the big fire, which destroyed all the palm leave printed- **Sinhala** books in to ash.

FIGURE-04(ruins of the Buddhist's seven storied wooden library)

බුද්ධ භාෂාව හෙවත් හෙළ බසින් රචිත තල්පත් පුස්තක හා ඉපැරණි ශිලා ලේඛණයන් විසින් බුද්ධ ශිෂ්ඨාචාරයෙහි තිඹිරිගෙය ශ්‍රී ලංකාවම බවට ප්‍රබල සාක්ෂි දරාසිටියි. පැරණි සිව්හෙල(සිංහල) ද්වීපයෙහි **මාගදී** බස පිළිබඳ ඉතිහාසය වසර 5000-7000 රාවනා යුගයකරා දිවෙනබවට සියලු ඓතිහාසික සාධක සනාථවෙමින් පවතියි. තවද ලක්බිමෙහි අදද ව්‍යවහාරයෙහි පවතින ගම් නගර, පර්වත නාම හා කුළගොත් නාම යනාදිය **මාගදී** බසින් විශ්ලේෂණය කිරීමේදී එම කරුණ මොනවට සනාථවෙයි.

4.6- The importance to see the 4 sacred places of Buddha's biography had been described by Buddha himself;

'සද්ධස්ස කුලපුතතසස දසසනීයානි **සංවේජනීයානි** ඨානානි කතමානි චත්තාරි'

'සමාන මානයන්ගෙන් පිහිටි යම් ස්ථාන සතරෙක් වෙත්ද සැදැහැවත් කුලපුත්තෙම එහි දැක්මෙන් නිවන්මග **සංවේදනය** කරන්නේය' "The 'Nibbana' path could be sensed by those who visit at the four places situated at the same dimensions."





**FIGURE-05**(Map of the four sacred places of Buddha's biography)

King Darmasoka(3rd BC) of India, has implemented a practical model of Buddha's biography in north India, behalf of Buddhist's pilgrimage under the guidance of thero Mogaliputtathissa.

ධර්මාසෝක රජතුමා නිරෝධ අරහත් සාමනේරයන් වහන්සේ දැක පැහැදීමට පත්ව බෞද්ධයකු බවට පත්වූයේ ක්‍රි පූ 2 වන සියවස අගභාගයේදීය.   අදමෙන් ප්‍රවාහණය පහසුනොවූ එසමයෙහි ඉන්දීය බොද්ධජනයාට වන්දනාමාන පිණිස මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගේ මගපෙන්වීම පරිදි ස්ථාපණය කොට නම්කරනලද බුද්ධසිරිතෙහි ප්‍රයෝගික ආකෘතිය අද උතුරු ඉන්දියාවේ දක්නට ඇත.

The four genuine sacred places of Buddha's biography with all the provable historical evidences are available in Sri Lanka. සියලුම ගම් හා නගර නාමාවලියද සමග ඔප්පුකළහැකි ඓතිහාසික සාධකද සහිත, බුද්ධසිරිතෙහි ගැනෙනා පූජාස්ථාන හැමෙකක්ම අද නටබුන්ව ශ්‍රී ලංකාවතුල පවතින අයුරු ඔබට දැකබලාගත හැකිය.

*END  නිමාව*

Date: 13.04.2020

Cyril H Thalpe Gamage